සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 | S | I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

**නම/විභාග අංකය : ...................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- I කාලය : පැය 01 යි.**

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.
- ✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

✳ **අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) ඇය විභාග ප්‍රතිඵල එනතුරු **ඇඟිලි ගනිමින්** සිටියි.
(1) දින ගණන් කරමින් (2) ඇඟිලි ගණන් කරමින්
(3) බලාපොරොත්තුවෙන් (4) කල්පනා කරමින්

(02) දරිද්‍රතාවයෙන් හා දැඩි අපහසුතාවයන්ගෙන් යුක්ත සිසුනට **අතදීම** හොඳ පුරුද්දකි.
(1) මිල මුදල් දීම (2) ප්‍රශංසා කිරීම
(3) උදවු කිරීම (4) අතිනත ගැනීම

(03) ඔහු නිතරම අල්ලේ පැළවෙන බොරු කියන තැනැත්තෙක් බවට පත් විය.
(1) තවත් කෙනකු රවටන බොරු බස් (2) කිසිවෙකුට විශ්වාස කළ නොහැකි දේ
(3) පුහුණු කෙනෙකු රවටන බොරු බස් (4) ඇදහිය නොහැකි තරම් දේවල්

(04) ඔහු කෙතරම් ඇනුම් පද කිව්ව ද සීතා කරබාගෙන සිටියා ය.
(1) හිස නමාගෙන (2) අත් පහළට නංවාගෙන
(3) නිහඬව (4) විනීත ලෙස

✳ **අංක 05 සිට 08 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(05) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමඟ සපිරිවරින් පැමිණි උගත්තු, ශිල්පීහු අප රට සංවර්ධන .......................... බවට පත් කළහ.
(1) ඒකකයක් (2) කේන්ද්‍රස්ථානයක් (3) මධ්‍යස්ථානයක් (4) ව්‍යාපාරයක්

(06) බාලාංශයේ පටන් විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ ලබාදෙන අධ්‍යාපන ක්‍රමයක් මෙරට .......................... කිරීමේ පුරෝගාමියා වූයේ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ය.
(1) සංවර්ධනය (2) ප්‍රතිනිර්මාණය (3) ස්ථාපනය (4) නිර්මාණය

(07) කාව්‍යය සඳහා යොදා ගන්නා කියමන් .................................... ලෙස හඳුන්වනු ලබයි.
(1) ධ්වනිපූර්ණ භාෂා (2) කාව්‍යෝක්ති (3) පරිකල්පනය (4) අවස්ථෝචිත යෙදුම්

(08) විශිෂ්ට ගණයේ කවියක් නිර්මාණය කරලීම සඳහා නිරන්තරයෙන් පුහුණු වීම හෙවත් .................................... අවශ්‍ය වේ.
(1) සතතාභ්‍යාසය (2) ප්‍රතිභාව (3) පරිකල්පනය (4) පරිශීලනය

(09) අකාරාදි පිළිවෙළ නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.
(1) නවීන්, ෂාරුක්, සාගර, කවීන් (2) ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, මීනා
(3) අනුරාධපුරය, කුරුණෑගල, කෑගල්ල, රත්නපුරය (4) කළු, කැළණි, මහවැලි, වලවේ

(10) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) විශ්වය, ආස්වාදය, විස්මයාවහ, විවිධාංගීකරනය (2) විශිෂ්ට, ශ්‍රේෂ්ඨ, කනිෂ්ඨ, උච්චාරණය
(3) ශිෂ්ඨාචාරය, වැලපීම, ජ්‍යෝෂ්ඨ, ප්‍රගමනය (4) බහ්වර්ත, සැලසුම අන්තස්ථාක්ෂර, නීත්‍යානුකුල

(11) පළාත්වල, මාතෘකාව, ඔරුව අනූන යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) ඇදය, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල
(2) ඇලපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කෙටි ඇදය, දීර්ඝ පාපිල්ල
(3) ඇලපිල්ල, ගයනු කිත්ත, ඇදය, දීර්ඝ පාපිල්ල
(4) ඇලපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල

(12) බොද්දී යන ක්‍රියා පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ,

(1) මිශ්‍ර ක්‍රියා (2) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
(3) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

(13) මොනරාගල ප්‍රදේශයේ''වහින්ටත් වපුරව්වා'' යනුවෙන් අදහස් කරන්නේ,

(1) වැස්ස වහිද්දී වපුරන්නේ නෑ ලෙස ය. (2) 'වහින්ඩ වපුරනවා' යන්න ය.
(3) වැස්ස වහිද්දීත් වැපිරූ බවකි. (4) වැස්ස වහින්නේ නැති දිනක වී වපුරන බව ය.

(14) ප්‍රාදේශික ව්‍යවහාර අනුව නිවැරදි ව පද සම්බන්ධ කර ඇති වරණය තෝරන්න.

A - සමනලයා
B - පුහුල්
C - අඹ
D - කොකිස්
E - වට්ටක්කා
F - කිරි අල
G - කුරුල්ලා
H - ගස්ලබු

(1) AG, BF, CH, DE (2) AG, BE, CH, DF
(3) AE, BF, CE, DH (4) AG, BH, CE, DF

**✳ අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(15) **පුරාණ කාලයට අයත්** සාහිත්‍ය නිර්මාණ හෙළ කලාකරුවන්ගේ නිර්මාණ ශක්තිය මොනවට කියා පායි.

(1) නූතන (2) චිරන්තන (3) තත්කාලීන (4) ප්‍රාග්ඓතිහාසික

(16) ඔහුගේ නිර්මාණයන් තුළින් ඔහු භාෂාව **මැනවින් පුරුදු පුහුණු වූ බවක්** දක්නට ලැබුණි.

(1) හසළත්වය (2) අවස්ථෝචිත (3) දක්ෂතාවය (4) නෛපුණ්‍යත්වය

(17) සමහරු අනාථ දරුවන් කෙරෙහි **අනුකම්පා සහගත** දෘෂ්ටියක් දක්වති.

(1) දායනුකම්පිත (2) සානුකම්පිත (3) ළයාන්විත (4) ශික්ෂාකාමී

(18) ත,ථ, ද, ධ, න යන අක්ෂර කාණ්ඩය අයත් වනුයේ,

(1) මූර්ධජ අක්ෂර ගණයට (2) දන්තජ අක්ෂර ගණයට
(3) නාසික්‍ය අක්ෂර ගණයට (4) ඌෂ්මාක්ෂර ගණයට

(19) A - ච, ජ, ඣ තාලුජ අක්ෂර වේ.
B - ය, ර, ල වර්ගාන්ත අක්ෂර වේ.
C - ඝ, ඡ, ඪ මහප්‍රාණ අක්ෂර වේ.
D - ශ, ෂ, ෆ අඝෝෂ ශබ්ද අක්ෂර වේ.
මේ ප්‍රකාශන අතරින් නිවැරදි යුගලය වනුයේ,

(1) A හා D ය. (2) B හා C ය.
(3) C හා D ය. (4) A හා B ය.

(20) එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** පද පේළිය වනුයේ,

(1) අටසාලිස් - හතළිස් අට, හිතෛෂීන් - හිතවතුන්, පර්ෂදය - පිරිස, අග්‍රභාගය - ප්‍රථම භාගය
(2) තිර - ස්ථිර, දොස් දෝෂය, දෙස් - දේශය, අබියස - ඉදිරිපිට
(3) කාරිය - කටයුත්ත, රුවන් මැණික්, දන්ත - දත්, ප්‍රයත්නය - උත්සාහය
(4) කන්ද- පව්ව, මිදුල - මළුව, ප්‍රාකාරය - පවුර, ආකරය - ආකාරය

(21) විරුද්ධාර්ථවත් පද යුගලක් නොවන්නේ කුමක් ද?

(1) වියත් - නොවියත් (2) අනුමාන - ප්‍රත්‍යක්ෂ
(3) ලස් - අනලස් (4) දුගඳ - කුයිල

✳ **අංක 22 සිට 24 දක්වා ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.**

(22) අතු කඩා මොර කන්නා සේ.
(1) අරමුණකින් තොරව වැඩ කිරීම.
(2) අය මාර්ගය මුළුමනින් ම විනාශ කර දැමීම.
(3) අතු කඩමින් අන් අයට දී මොර කෑවා වගේ.
(4) පොඩි දෙයක් විනාශ කර විශාල දෙයක් ආරක්ෂා කරලීම.

(23) පුංචි අම්මත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ.
(1) විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටිය ද ප්‍රතිඵල ඉතා කුඩා වීම.
(2) පුංචි අම්මා කැවුම් බදින විට කැවුම් පොඩි ව සැදීම.
(3) ලැබීමට ඇති සම්පත් ඉතා සීමිත වීම.
(4) අවාසි සහගත යමක් සැලසුම් සහගතව කරලීම.

(24) කැලේට පායපු සඳ වගේ.
(1) බලාපොරොත්තු සහගත දෙයක් නොලැබීම.
(2) කැලයට සඳ පායන්නා වගේ
(3) කිසිදු වටිනාකමක් නොමැති වීම.
(4) මෝඩ මිනිසුන්ට උතුම් දෙයක ඵලක් නොමැති බව.

(25) වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) අක්ෂර මාලාවක් යනු සංකේත සමූහයකින් සැදුම් ලත් විශේෂ සටහනකි.
(2) තාලුජ අක්ෂර නමින් හඳුන්වනු ලබන්නේ දිවේ මැද කොටස තල්ල වෙත සමීප වන නිසා උපදින ශබ්ද වේ.
(3) 'ෆ' අක්ෂරය ඌෂ්මාකාරයට උදාහරණයක් වේ.
(4) පූර්ව ක්‍රියා පදයක් යනු වාක්‍යයක අවසාන ක්‍රියා පදයට පෙර කරන ලද යැයි සැළකෙන ක්‍රියා පදයකි.

(26) **මං තනන්නෝ** කෙටි කතාව රචනා කරන ලද්දේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.
(2) මහගමසේකර මහතා ය.
(3) මනෝ ප්‍රනාන්දු මහතා ය.
(4) ශ්‍රී රාජශේකර මහතා ය.

(27) **පරිපෝෂිත** යන්නෙන් අදහස් කෙරෙන්නේ,
(1) අංග සම්පූර්ණ වූ
(2) ඌන පෝෂණය වූ
(3) මනාව පෝෂණය වූ
(4) තවදුරටත් පෝෂණය කළ යුතු වූ

(28) පහත නාමපදවල ප්‍රකෘතිය නිවැරදිව දක්වා ඇති වරණය වනුයේ,
A - කන්ද - කඳු
B - ගිරවු - ගිරවා
C - යහපත - යහපත්
D - මිනිසා - මිනිස්සු
මින් නිවැරදි යුගලය වනුයේ,
(1) A හා B ය.
(2) B හා D ය.
(3) A හා C ය.
(4) D හා C ය.

(29) මිශ්‍ර ක්‍රියා පද පමණක් ඇති පේළිය කුමක් ද?
(1) කියමින්, කියා, බලද්දී, කපද්දී
(2) කප කපා, සිටවමින්, සිතුවොත්, බලවයි.
(3) නට නටා, ගයමින්, බලමින්, සොයමින්.
(4) කැපුවොත්, කිය කියා, ලියමින්, නටමින්

(30) උක්ත පද පමණක් යොදා ඇති පද පේළිය වනුයේ,
(1) සේවකයෙක්, දරුවන්, තා, තොප
(2) නුඹ, ඇය, තොපි, දැරියක
(3) රජවරු, මිත්තණියන්, මලණුවෝ, පියාණන් දැ
(4) ගංගාවෝ, තෝ, නුඹ, සමහරෙක්

(31) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) උපසර්ග - ප, පර, අව, සිරි
(2) පූර්ව ක්‍රියා - කියා, නටා, ගයා, කපා
(3) ප්‍රත්‍ය - ඉක, මත්, වත්, අටි
(4) විධි ක්‍රියා - කරව, බලන්න, කපන්ඩ, දකිනු

(32) නිවරදි ඡත්‍ර (තනි) පදය තෝරන්න.
මුඛ පරම්පරාවෙන් පැවතෙන කථා
(1) මුඛ්‍යාර්ථ (2) කෙටිකථා
(3) ජනප්‍රවාද (4) කටකථා

(33) පහත සඳහන් ගී ඛණ්ඩයේ දෙවන පදය තෝරන්න.
නව වැස්සට වැව පිරිලා - ...........................................................
ඒ අතටයි මේ අතටයි - නැමී වැනෙනවා
(1) රන් අස්වනු නෙළන දාට (2) නීල ගොයම කිරි වැදිලා
(3) උඹේ සිනා කිරි උතුරා (4) කෙකටිය මල් උඩ ඇදිලා

(34) චෛත්‍යයෙහි බුබ්බුලාකාරය නැංවුණේ පුප්ඵාධාන යන නමින් හැඳින්වුණු කෙමෙන් පිහිටි තුන්මාල් පේසාව උඩය.
(1) වේදිකා භූමිය (2) සෑය වටා ඇති සෑ ගෙය
(3) වාලුකාංගණය (4) ප්‍රාකාරය

✳ **අංක 35 සිට 38 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.**

(35) (1) සියලුම ශිෂ්‍යයන් දේශනයට සහභාගි වූහ.
(2) දේශකයාණෝ රැස්වීම අමතයි.
(3) ඔවුහු ක්‍රීඩකයන් නො වේ.
(4) නැන්දා සිනා සිසී මා දෙස බැලුවා ය.

(36) (1) තැඹිලි ගසට ගිය මිනිසෙක් තැඹිලි කැඩූහ. (2) සියලු ම ගංගාවෝ සමනළ කන්ද සිට ගලා බසියි.
(3) සිල් මෑණියෝ දනට වැඩියහ. (4) ඇය බලහත්කාරයෙන් තම දූ දරුවන් රැගෙන ගියහ.

(37) (1) ගංගා ඇළදොළ මුහුදට ගලා බසිති. (2) බුදුන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටියේ ය.
(3) ගුරුවරු විසින් ශිෂ්‍යයෝ යහමඟ යැවෙති. (4) අපි සියල්ලෝ ම ඒ දෙස බලා සිටියෙමු.

(38) (1) මෑණියෝ ආහාර වළඳයි.
(2) තා හොඳින් ඉවසීමෙන් කටයුතු කරන්නෙහි.
(3) දූවරු සිනාසෙන විට අම්මා කෝප වූහ.
(4) වනය දෙවනත් කරමින් ශිෂ්‍යයෝ බිංදුයි ටිකිරියි සෙවූ හ.

(39) ''සූරිය මල අහස් තලේ සිනා මවන - හිමිදිරියේ
- අගනගරේ - මහවීදියෙ - මංසන්දියෙ''
ඉහත සඳහන් කවියේ රචකයා වනුයේ,
(1) කුමාරතුංග මුනිදාස මහතා (2) පරාක්‍රම කොඩිතුවක්කු මහතා
(3) රත්න ශ්‍රී විජේසිංහ මහතා (4) මහගම සේකර මහතා

(40) මුලින් දී ඇති කොටසේ අර්ථයට වඩාත් ගැළපෙන කොටස දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.
''රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ජනතාව සහය දිය යුතු ය.''
(1) නීතිය සාමය කඩන්නවුන්ට දඬුවම් දිය යුතු ය.
(2) ජනතාව වැරදි දේට පෙළඹීමෙන් නීතිය බිඳ වැටේ.
(3) නීතිය හා සාමය රකින ආයතනවල උපදෙස් නිසි ලෙස පිළිපැදීමෙන් රටක නීතිය හා සාමය රැකේ.
(4) පොලිස් ආරක්ෂාව හා ජනතාව අතර සම්බන්ධතා වැඩිය යුතු ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 | S | II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ......................................සිංහල භාෂාව හා සාහිත්‍යය- II කාලය : පැය 02 යි.

✳ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. නොලියන කොටස් ඇත්නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇති අර්ධස්වර හතර ලියන්න.

(ii) පහත දැක්වෙන පාඨයෙන් උපසර්ග සහිත පද දෙකක් උපුටා ලියන්න.

''සාමාන්‍ය ඇතුන්ගේ අඩි සලකුණු අතර, සුවිශේෂ විසල් අඩි සලකුණු දුටුවහොත් මා අනිවාර්යයෙන් ම හඹා යන්නේ ඒ විසල් අඩි සහිත හස්ති රාජයාය.''

(iii) මොනරාගල ප්‍රදේශයේ භාවිතවන පහත සඳහන් පද සඳහා පොදු ජන වහර ලියන්න.

(අ) ගහමච්චා - (ආ) කුදහනවා -

(iv) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.

(අ) ගොවියා - (ආ) යතුර -

(v) 'කප' යන ධාතු ප්‍රකෘති ඇසුරෙන් පහත සඳහන් ක්‍රියා පද වර්ග ගොඩනඟන්න.

(අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා - (ආ) විධික්‍රියා -

(vi) පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සමානාර්ථ පදය බැගින් ලියන්න.

(අ) මළුව - (ආ) ස්තූපය -

(vii) පහත සඳහන් ඉඟිවැකි මඟින් පළවන අර්ථය ලියා දක්වන්න.

(අ) හමස්පෙට්ටියට යැවීම - (ආ) ඉහනිකට බලා -

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) පිහිට පතා ගිය තැනකින් විපතක් සිදුවීම -

(ආ) අධමයන්ට උතුම් දෙයක් පලක් නැති කම -

(ix) පහත සඳහන් පාඨයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

''නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිපල බුක්තිවිදින සෑම පුරවැසියෙක්ම එතුමාට ණය ගැති වෙයි.''

(x) පහත සඳහන් අනුක්ත පදවලට උක්ත රූප ලියා දක්වන්න.

(අ) කාර්මිකයකු (ආ) ඔවුන් (ලකුණු 2x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 25)

(අ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අද බටහිර රටවල පවා ප්‍රචලිත වෙමින් පවතියි. එය සොබාදහම හා බැඳුණු වෛද්‍ය ක්‍රමයකි. දේශීය ඖෂධ භාවිතයේ වැදගත්කම හා එයින් රටට ලැබිය හැකි ඵල ප්‍රයෝජන පිළිබඳව අදහස් දක්වමින් රචනයක් ලියන්න.

(ආ) ජීවිතයේ හොඳම අවධිය ළමා කාලයයි. අධ්‍යාපනය ලබන කාල සීමාවයි. පාසල් කාලය හෝ ළමා කාලය අපට ආපසු ලබාගත නොහැකි ය. එහෙයින් අපේ ළමා කාලයේ පාසල් අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට උනන්දු විය යුතු ය. මේ ඇසුරෙන් රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.

(ඉ) සොබාදහම මිනිසාට සලසන්නේ අපමණ මෙහෙයකි. එහෙත් මිනිසා සොබාදහමට එරෙහිව ගොස් කටයුතු කරයි. මිනිසා සොබාදහමට කරන අයහපත් බලපෑම් නිසා වර්තමානයේ සොබාදහම මිනිසාට විපත් පමුණුවන බවට උදාහරණ බොහෝ ය. මේ තොරතුරු ඇසුරින් රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ඊ) ඔබ ගිය අධ්‍යාපන හෝ විනෝද චාරිකාවක් පිළිබඳව ගමනේ අරමුණු ගමන් මඟ, අතරමග මුහුණදුන් සිදුවීම් හෝ ගමන තුළ මුහුණදුන් අත්දැකීම් ආදිය සිහියට නගමින් රචනයක් ලියන්න සුදුසු මාතෘකාවක් යොදන්න.

(03) පහත දැක්වෙන ඡේදය කියවා වචන 50 - 60 ත් වනසේ සාරාංශ කර ලියන්න. ඔබේ පිළිතුරේ වචන සංඛ්‍යාව පහතින් සඳහන් කරන්න.

එක් එක් භාෂාවට සුවිශේෂ වූ සාහිත්‍යයක් ද බොහෝ විට ඇති බව අපි දනිමු. ඇතැම් භාෂාවකට සාහිත්‍යයක් නොමැති විය හැකි වුවද බොහෝ භාෂාවලින් ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ ඇත්තේ ය. මේ අතර කාව්‍යයට ද විශේෂ තැනක් හිමි වෙයි. මේ කාව්‍යයන් නිර්මාණය කර ඇත්තේ ඒ ඒ කාලවල විසූ උගතුන් විසිනි. උදාහරණ වශයෙන් කව්සිළුමිණ ගුත්තිල කාව්‍යය, සැළලිහිණි සංදේශය ආදී කෘතින් දැක්විය හැකි ය. මේ එක් එක් කාව්‍යය කිසියම් අවධියක කිසියම් එක් ලේඛකයෙකු විසින් රචනා කරන ලද බවට සැකයක් නැත. සැළලිහිණි සංදේශය ජයවර්ධනපුර කෝට්ටේ විසූ රාහුල හිමියන් ලියූ කෘතියකි.

උගතුන් විසින් සම්පාදනය කරනු ලැබූ මෙවැනි කෘතිවලට අමතරව, ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී එන තවත් කාව්‍ය වර්ගයක් ද ඇත. ඒවා සාමාන්‍යයෙන් ජනකවි නමින් හැඳින්වේ. මේ අනුව ජනකවි ගැන කරුණු දෙකක් දැක්විය හැකියි. උගත් සාහිත්‍යයක් ඇතත් නැතත් ඕනෑම ජන කොටසක් අතර ජනකවි පහළ විය හැකි ය. පහළවන බව පළමු වන කරුණය. දෙවැන්න නම් උගත් සාහිත්‍යයක් පහළ වීමට පෙරාතුව ජනකවි පහළ වීම ස්වාභාවික බව ය. ලෝකයේ ඕනෑම භාෂාවක් හා සාහිත්‍යයක් ගෙන බැලුව ද උගත් කවීන් කවි ලිවීමට පෙර පටන් පැවැත එන ජනකවි සාහිත්‍යයක් ඇති බව පිළිගත් මතයකි. (ලකුණු 10)

(04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ලොව මෙසේ ප්‍රචලිත වූ කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ විසිවන සියවසේ මුල් භාගයේ දී ය. පැරණි කතා කලාවෙන් ක්‍රම විකාශිත විශ්ව කෙටිකතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර කටයුත්තක් වන්නා සේ ම සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම ද දුෂ්කර කටයුත්තක් වන්නේ ය. එයට හේතුව සිංහලයෙහි අනාදිමත් කාලයක සිට සංවර්ධිත කතා කලාවක් බිහිවීමත්, සිංහල කෙටිකතාව එහි විකාශයක ලකුණු පළ කිරීමත් ය. ජන කතා, සද්ධර්මරත්නාවලි කතා, සද්ධර්මාලංකාර කතා ආදී සිංහල කතා ඇසුරේම උපන් නව්‍ය වූ කතා ක්‍රමයක් ලෙස ඇතැම්හු සිංහල කෙටි කතාව දකිති. සිංහලයෙහි පළ වූ ප්‍රථම කෙටිකතා සංග්‍රහය ලෙස දැනට පිළිගැනෙනුයේ 1924 දී පළ වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ගැහැනියක් ''කෙටිකතා සංග්‍රහයයි. එඩ්. ඒ. සිල්වාගේ කතාවන්හි ද කෙටිකතා ලක්ෂණ දක්නට ලැබෙතුදු ඔහුගේ මුල් ම කෙටිකතා සංග්‍රහය වූ ''දෙයියන්ගේ රටේ'' පළව ඇත්තේ 1927 දී ය.

(i) කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ කුමන කාලයේ ද?

(ii) සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර වන්නේ ඇයි?

(iii) සිංහල කෙටි කතාව නව්‍ය වූ කතා ක්‍රමයක් ලෙස ඇතැමුන් හඳුන්වන්නේ කුමක් නිසා ද?

(iv) පළමු සිංහල කෙටි කතාව පළ වූ වර්ෂය හා එම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

(v) පළමු කෙටිකතා සංග්‍රහය රචනා කළේ කවුරුන් ද? (ලකුණු 2x5=10)

(05) බුවනෙකගම, බුවනෙකබා ජාතික පාසලේ සමාජ විද්‍යා සංගමයේ ලේකම් මාලක මාලින්ද ඔබ යැයි සිතා, සහන බැංකුවේ ශාඛාවක් ඔබ පාසලේ පිහිටුවීමට අවශ්‍ය බව දන්වමින් එම බැංකුවේ කළමනාකාරතුමාට යවන ව්‍යාපාරික ලිපිය ලියන්න. (ලකුණු 15)

**නැතහොත්**

ශ්‍රී ලාංකේය සංගීත ක්ෂේත්‍රයට මහගු සේවයක් ඉටු කළ හෙළයේ මහා ගාන්ධාර්වයා වන පණ්ඩිත් ඩබ්ලිව් ඩී. අමරදේව මහතාගේ ගුණ සමරු උලෙළ නාමල්ගම මහා විද්‍යාලයේ 2020.03.22 දින පෙ.ව. 10.00ට පැවැත්වීමට පාසලේ සෞන්දර්ය අංශය කටයුතු සංවිධානය කරයි. ඒ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වේ. මේ සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S III

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : .................................. සිංහල භාෂාව හා සාහිත්‍යය- III කාලය : පැය 02 යි.

වැදගත් :

- ✳ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✳ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

---

(01) (i) සිට (x) තෙක් සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු අවධියේ විසූ රජතුමා කවුරුන් ද?
(ආ) ඉහත ජාතක පොත ලියුවේ කුමන යුගයේ ද?
(ii) (අ) ''සලාවත ජයපාල'' කිනම් රජතුමාගේ අග්‍රාමාත්‍යවරයා ද?
(ආ) ගුත්තිල කාව්‍යයේ කතු හිමියන්ගේ නම ලියන්න.
(iii) 'සබඳ තොප විසින් කුමක් දක්නා ලද ද''
(අ) මෙහි සබඳ යනුවෙන් ඇමතුම් ලබන්නේ කවුරුන් ද?
(ආ) මෙසේ අසන තැනැත්තාගේ නම කුමක් ද?
(iv) එමා සත්හු වෙණ නද අසමානය
සමා නොවෙති කොවුලෝ උපමානය
..........................................................................
..........................................................................
(අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(ආ) උපමානය යන්නට සමාන පදයක් ලියන්න.
(v) (අ) දැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතිය කුමක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත ලියවුණ සියවස කුමක් ද?
(vi) (අ) ජාතක කතා ආකෘතියේ එක් අංගයක් නම් කරන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට මුලාශ්‍ර වූ කෘතිය කුමක් ද?
(vii) (අ) ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගණන කීයද?
(ආ) ගුත්තිල කාව්‍යයේ මුල් ම කවිය කුමන කාව්‍ය ගණයකින් අරඹා ඇත් ද?
(viii) (අ) ''කව්සිළුමිණ'' ලියා ඇත්තේ කුමන කාව්‍ය විරිතකින් ද?
(ආ) උම්මග්ග ජාතකය ලිවීමේ අරමුණ කුමක් ද?
(ix) (අ) ගුත්තිල කාව්‍යයට පදනමවන කතාව කුමක් ද?
(ආ) ගුත්තිල කාව්‍ය කතු හිමිගේ ගුරුතුමා කවුරුන් ද?
(x) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට අනුග්‍රහය දැක්වූයේ කවුරුන් ද?
(ආ) මහෞෂධ පඬිඳුන්ගේ දේවියගේ නම කුමක් ද? (ලකුණු 2X10=20යි)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) <u>කන්කලු</u> වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දූල් කොලහන වන බියෙනේ
<u>සන් සල</u> නොව එහි පිළිරූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(ii) .................. අද වකට මෙතෙක් නුවර ගන්නා ලද, පණ්ඩිතයන් වහන්ස, නොපමා වන සේක්වා''යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන් වහන්සේ ද ඒ යෝධයනට, ''මම මෙහි පමාවක් නැත්තෙමි. තෙපි උකටලී නො වැ නොපමා වැ වසව'' යි කියා යවන සේක.
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත පණිවිඩ හුවමාරුවට හේතුව කෙටියෙන් ලියන්න.

(iii) අසන රිසින් නයි කැල ඔසළෝයා
ඔවුන වෙතම සිටිනා ගුරුළෝයා
වයන එ වෙණ නද ලොබම කළෝයා
එදින වයිර සිත සිහි නොකළෝයා
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) එදින නයි කැල හා ගුරුළන් වෛර සිහි නොකළේ ඇයි?

(iv) මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක්හු මෙන් ද දුන්නක් අල්ලාගෙන වඳුරු මුලක් පලවන එකක්හු පරිද්දෙන් ද මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව බඩැ බන් කඩ පමණකටත් අස්වාමික කරවා නිගන්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියමි.
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙහි දක්වෙන උපමා දෙකක් ලියන්න.

(v) නොගොසින් සිට සිටිවන නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නොමඳේයා
සතොසින් විඳ විඳ ලොබ නොසිඳේයා
මෙලෙසින් වෙණ නද අසන සඳේයා
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම කවියේ විස්තරවන අවස්ථාවෙන් පසු සිදු වූ දෙය කෙටියෙන් ලියන්න. (ලකුණු 4X5=20යි)

(03) (i) කේවට්ට බමුණාගේ කූට බුද්ධියත්,
(ii) මහෞෂධ පඬිදුන්ගේ ප්‍රඥාවන්ත බවත්
සතර කන් මන්ත්‍රණය පාඩමමෙන් ඉස්මතු වන ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) වෙණ නද ඇසුවන්ගේ සුවිශේෂ හැසිරීමත්,
(ii) සුරඟන රැඟුමේ අපූර්වත්වයත් රසික සිත් ඇඳ බැඳ ගනී. මේ කියමන ගුත්තිල වෙණ නද පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

(04) (i) වීරත්වය
(ii) හාස්‍ය යන කරුණු ඉස්මතු කරමින් චරිත නිරූපණය කර ඇති ආකාරය උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්,**

(i) සරල බස් වහරක් භාවිතයත්
(ii) ප්‍රබල කාව්‍යෝක්ති යොදා ගැනීමත් යන කරුණු අතින් ගුත්තිල කාව්‍ය රසවත් කාව්‍යයක් වී ඇති ආකාරය නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

★ **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

(05) සංවාදාත්මක බස් වහරක් භාවිත කිරීමෙන් ප්‍රබල ලෙස අවස්ථා නිරූපණය කර ඇති ආකාරය සතර කන්මන්ත්‍රණය පාඩමින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) අර්ථ රසය හා ශබ්ද රසය මැනවින් සංකලනය කර අපූර්ව කාව්‍ය සංකල්පනා ඉදිරිපත් කර ඇති ආකාරය ගුත්තිල වෙණ නද පාඩමින් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) මහෞෂධ පඬිදුන්ගේ උපායශීලී බව මියුලු නුවර ආරක්ෂා වීමට හේතු විය. උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

21 S I,II,III

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 4 | (21) - 4 | (31) - 1 |
| (2) - 3 | (12) - 3 | (22) - 2 | (32) - 3 |
| (3) - 2 | (13) - 3 | (23) - 1 | (33) - 1 |
| (4) - 3 | (14) - 2 | (24) - 3 | (34) - 2 |
| (5) - 2 | (15) - 2 | (25) - 1 | (35) - 4 |
| (6) - 3 | (16) - 1 | (26) - 2 | (36) - 3 |
| (7) - 2 | (17) - 2 | (27) - 3 | (37) - 4 |
| (8) - 1 | (18) - 2 | (28) - 3 | (38) - 4 |
| (9) - 4 | (19) - 1 | (29) - 3 | (39) - 2 |
| (10) - 2 | (20) - 4 | (30) - 4 | (40) - 3 |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

(01) (i) ය, ර, ල, ව
(ii) සලකුණු විසල්, සුවිශේෂ
(iii) (අ) විසිකළා (ආ) නිදාගන්නවා
(iv) (අ) ගොවි + ආ (ආ) යතුරු + අ
(v) (අ) කපවයි
(ආ) කපනු, කපනු මැනවි, කපන්න.
(vi) (අ) මිදුල (ආ) චෛත්‍යය, දාගැබ, සෑය
(vii)(අ) ක්‍රියාත්මක නොවී තිබීම.
(ආ) තරාතිරම බලා
(viii)(අ) වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වගේ
(ආ) ඌරෝ කවදද කහ කෑවේ
(ix) ප්‍රතිඵල, භුක්ති විඳින
(x) (අ) කාර්මිකයෙක් (ආ) ඔවුහු
(ලකුණු 2x10=20)

(02) රචනය
(i) සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව
ලකුණු 08
(ii) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය
ලකුණු 12
(iii) ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම
ලකුණු 05
**(මුළු ලකුණු 25)**

(03) සාරාංශකරණය
(i) අන්තර්ගතය = ලකුණු 06
(ii) වචන ගණන = ලකුණු 02
(iii) ශිල්පීය දක්ෂතා = ලකුණු 02
**(මුළු ලකුණු 10)**

අන්තර්ගතය
* බොහෝ භාෂාවලට සුවිශේෂ සාහිත්‍යයක් ඇත.
* උගතුන් විසින් ලියන ලද කාව්‍යයට විශේෂ තැනක් හිමි වේ.
* සෑම කාව්‍යයක් ම කවර හෝ යුගයක එක් ලේඛකයෙකු විසින් ලියැ වී ඇත.
* ජනතාව අතරම ඇති වී ආරක්ෂා වී එන කවි ජන කවි වේ.
* උගත් සාහිත්‍යයක් නැති ජන කොටසක් තුළ වුවද ජන කවි බිහි විය හැකි ය.
* උගතුන් කවි ලිවීමට පෙර පටන් ම ජන කවි සාහිත්‍යය බිහි වී ඇත. (ලකුණු 2x5=10)

(04) අවබෝධය
(i) විසිවන සියවසේ මුල් භාගයේ දී
(ii) සිංහලයේ ආනාදිමත් කාලයක සිට සංවර්ධිත හා කතා කලාවක් බිහිවීමත් එහි සිංහල කෙටි කතාවක විකාශය පහළ වීමත් ය.
(iii) ජාතක කතා, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මලංකාරය ආදී සිංහල කතා ඇසුරේම උපන් නිසා
(iv) 1924, ගැහැනියක් කෙටි කතා සංග්‍රහය
(v) මාර්ටින් වික්‍රමසිංහ මහතා (ලකුණු 2x5=10)

(05) ව්‍යාපාරික ලිපිය
ආකෘතිය ලකුණු 05
අන්තර්ගතය ලකුණු 07
ශිල්පීය දක්ෂතා ලකුණු 03
මුළු ලකුණු 15

නැතහොත්
ආරාධනා පත්‍රය
(1) ආකෘතිය 06
(i) මාතෘකාව 01
(ii) නිර්මාණාත්මක භාවය 02
(iii) ආරාධනා කරන්නා 01
(iv) ආරාධිත දිනය 01
(v) ආරාධිත ස්ථානය 01

(2) අන්තර්ගතය 06
(i) අරමුණ 01
(ii) පැවැත්වෙන දිනය 01
(iii) පැවැත්වෙන වේලාව 01
(iv) පැවැත්වෙන ස්ථානය 01
(v) ආරාධනය කුමක් සඳහා ද යන්න 01
(vi) ආරාධනය ලබන්නා 01
(3) ශිල්පීය දක්ෂතා ලකුණු 03
(සම්පූර්ණ ලකුණු 15යි.)

## III පත්‍රය

(01) (i) (අ) iv වෙනි පරාක්‍රමබාහු
(ආ) කුරුණෑගල යුගය
(ii) (අ) vi වෙනි පරාක්‍රමබාහු රජතුමාගේ
(ආ) වැත්තෑවේ හිමි
(iii) (අ) ගිරා පෝතකයා
(ආ) ඔහෞෂධ පඬිතුමා
(iv) (අ) තමා නාද මිහිරැයි යනමානය
දමා එයින් වින්දෝ අවමානය
(ආ) උපමාව
(v) (අ) දම්පියා අටුවා ගැට පදය
(ආ) 14 වෙනි සියවස
(vi) (අ) වර්තමාන කතාව / අතීත කතාව /සමෝධානය
(ආ) පාලි ජාතකට්ඨ කතාව
(vii) (අ) 511යි
(ආ) වායු ගණය
(viii)(අ) ගී විරිත
(ආ) මහෞෂධ පඬිදුන්ගේ බුද්ධ මහිමය කියා පෑම සඳහා
(ix) (අ) ගුත්තිල ජාතකය
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(x) (අ) වීරසිංහල පතිරාජ ඇමති
(ආ) අමරා දේවිය (ලකුණු 2x10=20)

(02) (i) (අ) කනට මිහිරි
චංචල යන අදහස
(ආ) කනට මිහිරි වූ වීණා නාදය ඇසීමේ අශාවෙන් රන් රසු දූල් කෝලහල වෙතැයි යන බියෙන්, චංචල නො වී එහි පිළිරූ මෙන් නොයෙක් අශ්ව සේනාවෝ නිසල ව හිටිවන ම සිටියෝ ය.
(ii) (අ) අද වන විට / උදාසීන යන අදහස
(ආ) චූලනී බ්‍රහ්ම දත්ත රජ එක් සියයක් රජ දරුවන් පිරිවරාගෙන මියුලු නුවර වට ලැමට පැමිණෙමින් සිටීම.
(iii) (අ) කැමැත්තෙන් / ඔවුන් ළඟම
(ආ) වීණා නාදයට ආශා කිරීම නිසා
(iv) (අ) ඉනට ඇඳි රෙදි කඩ / ඉන බැඳි රෙද්ද (වැනි අදහසක් )
අභිමව, හිමිකමක් නැතිව
(ආ) මම ගල් කැටයක් රැගෙන කපුටන් රංචුවක් පලවා හරින කෙනෙකු ලෙස ද / දුන්නක් ගෙන වදුරන් සමූහයක් එළවා දමන කෙනෙකු ලෙස ද / නිගණ්ඨ සේනාවක් ලෙස

(v) (අ) සිටිතැන්වලම / ආශාව
(ආ) සුරගනන් නමසීයක් දෙන වීණා වාදන භූමියට පැමිණ නැටීමට පටන් ගැනීම.
(ලකුණු 4X5=20යි)

(03) (i) **කේවට්ටගේ කූඨ බුද්ධිය**
★ සතර කන්මන්ත්‍රණ අවස්ථාව
★ ශ්‍රී යහන් ගර්භයේ සිට කල්පනා කිරීම
★ ධර්ම යුද්ධය සැලැසුම් කිරීම
★ මියුලු නුවරට දර, පැන්, සහල් නැවැත්වීමේ උපාය
★ එක් සියයක් රජ දරුවන් මැරීමට සැලසුම් කිරීම.
(ii) **මහෞෂධ පඬිදුන්ගේ ප්‍රඥා මහිමය**
★ රාජධානිවල චර පුරුෂයන් රැඳවීම.
★ ගිරා පෝතයාගේ තොරතුරු ප්‍රයෝජනයට ගැනීම.
★ ධර්ම යුද්ධය පැරදවීම.
★ නගරයේ ධනවතුන් පදිංචි කරවීම.
ඉහත ආකාරයේ සුදුසු උදාහරණ
නැතහොත්
(i) ★ කන්කළු වෙණ නද .....
★ මන්මත් කරවන ........
★ සතොස් කරන ......
මෙවැනි සුදුසු උදාහරණ
(ii) ★ ළඟ ළඟ වා ...... ★ යටසින් ........
★ රූ රසේ ..... ★ පුන් මදාරා .......
ඉහත උදාහරණ 2ක් (ලකුණු 15යි)

(04) (i) ★ සුරා පානය වැළැක්වීම (යෝධයන් යැවීම)
★ ධර්ම යුද්ධය
★ වේදේහ රජු ඇතුළු පිරිසකගේ බිය දුරු කිරීම
වැනි සුදුසු උදාහරණ
(ii) ★ ගිරාපෝතකයා වසුරු හෙළීම
★ ධර්ම යුද්ධය පැරදීම
★ දර, වතුර, සහල් උපාය පැරදීම
ආදී සුදුසු උදාහරණ
**නැතහොත්**
(i) ★ 1- 8 කවි ★ 11- 13 කවි
(ii) ★ කන්කලු වෙණ නද .......
★ පන්සිළු වීණා .....
★ වර වෙණ නද .....
ආදී ගැළපෙන කවි (ලකුණු 15යි)
(05) ★ චූලනී රජු හා කේවට්ට අතර සාකච්ඡා
★ වේදේහ හා මහෞෂධ පඬි අතර සාකච්ඡා
★ චූලනී රජ හා තලකා දේවි අතර සාකච්ඡා
★ චර පුරුෂ, ගිරා මහෞෂධ පඬි අතර සාකච්ඡා
ආදී ලෙස සුදුසු උදාහරණ (ලකුණු 10යි)

(06) කරුණු දෙකම සහිත සුදුසු උදාහරණ (ලකුණු 10යි)

(07) ★ චරපුරුෂ සේවා
★ මියුලු නුවර වැට ලූ අවස්ථාවේ ගත් පියවර
★ ධර්ම යුද්ධය
ආදී සුදුසු උදාහරණ (ලකුණු 10යි)